මාලදිවයින් ජනාධිපති අතිගරු මවුමුන් අබ්දුල් ගයුම් මැතිතුමනි, එම මැතිණියනි,
ගෞරවනීය අමුත්තනි,
නෝනාවරුනි, මහත්වරුනි

අප මිත්‍ර මාලදිවයින් ජනාධිපතිතුමාට සහ වැසියන්ට අප නියෝජිත පිරිස වෙනුවෙන් මා සුබ පැතුම් පිරිනමනවා. එසේම ශ්‍රී ලංකා ජනාධිපති වශයෙන් පළමු වරට ඔබේ සුන්දර රටට පැමිණි පසු උණුසුම් ආකාරයෙන් පිළිගැනීම සම්බන්ධයෙන් මාගේ කෘතඥතාව පුද කරනවා.

ඉන්දියානු සාගරයේ ඇතින් පිහිටි රටවල් දෙකක් වුවත් අප දෙරට අතර බොහෝ සමානතා දක්නට ලැබෙනවා. වසර දෙදහසකටත් වඩා වැඩි සාඩම්බර අතීත සංස්කෘතික උරුමයකට අප දෙරට හිමිකම් කියනවා. එසේම අප දෙරටේ භාෂා අතර ද සමානතා රැසක් දක්නට ලැබෙනවා.

තානාපති සම්බන්ධතාවලදී මෙන්ම නොබැඳි ජාතීන්ගේ සමුළුව හා සාර්ක් කලාපයේ සාමාජිකත්වය ලැබීමෙන් පමණක් නොව අපගේ වටිනාම සම්පත වන අප ජනතාව සංවර්ධනය කිරීමට වන අපගේ පොදු වුවමනාව හරහා අපගේ මෙම බැඳීම් ශක්තිමත් කිරීමට හැකි වන බව මම අවධාරණය කිරීමට කැමතියි. අපගේ ජාතීන්ට ස්ථිරසාර සමෘද්ධියක් මෙන්ම ආර්ථික සංවර්ධනයක් උදා කිරීම සඳහා කටයුතු කිරීමෙන් වෙළඳ හා වාණිජ අංශයේ සංවර්ධනය ද උදා කිරීමට අප බැඳී සිටිනවා.

නෝනාවරුනි, මහත්වරුනි

සංවර්ධනය සඳහා යන ගමනේදී ගෝලීයකරණය තුළින් අපට අවස්ථා මෙන්ම අභියෝග ද සපයා තිබෙනවා. ආර්ථික සංවර්ධනය සඳහා අපගේ දැක්ම නවීන හා ගෝලීයකරණයට නැඹුරු දෘෂ්ටියකින් යුක්ත විය යුතුය. එබැවින් ඉදිරි සංවර්ධන සම්බන්ධතා සඳහා නිර්මාණාත්මක නව සාමූහිකත්ව ක්‍රියාමාර්ග අපට අවශ්‍යයි.

ශ්‍රී ලංකාව අලුත් පළතුරු, එළවළු ඇතුළු කෘෂිකාර්මික නිෂ්පාදන මෙන්ම සකස් කරන ලද ආහාර ද්‍රව්‍ය සහ තේ, රෙදිපිළි සහ නිමි ඇඳුම් සහ පිඟන් භාණ්ඩ සහ ප්ලාස්ටික් නිෂ්පාදන අපනයනය කරයි. 2005 වර්ෂයේ දී අපගේ අපනයන ඇමරිකානු ඩොලර් මිලියන 24.76ක් හා ආනයන ඇමරිකානු ඩොලර් මිලියන 21.09ක් විය. අප දෙරට අතර පවත්නා නව වෙළඳ ගිවිසුම අනුව වෙළඳාමේ දී වඩා ප්‍රමුඛත්වය ලබා දීම සිදු වේ. සාම්ප්‍රදායික නොවන අංග ඇතුළු නිෂ්පාදන පදනම් කර ගත් අපගේ පුළුල් වෙළඳ ධාරිතාව ඉහළ නංවා ගැනීම සඳහා මාර්ග අප සොයා ගත යුතුයි.

අපගේ වැඩකරන ජනතාවගේ හැකියා පිළිබඳව ශ්‍රී ලංකාව ආඩම්බර වෙනවා. විශේෂයෙන් රෝහල් ක්ෂේත්‍රය තුළත්, මාලදිවයිනේ පුහුණු ශ්‍රමික ඉල්ලුම සපුරාලීමට අපට ශක්ති සම්පන්න හැකියාවෙන් යුතු ජනතාවක් සිටිනවා.

PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

අපගේ අභිලාශයන් සමඟින් නිදහස් වෙළඳ ආර්ථිකයේ ධනාත්මක දර්ශනය ඒකාබද්ධ කිරීම මගේ රජයේ ප්‍රතිපත්තියයි. ග්‍රාමීය සංවර්ධනය සහ අපගේ ගම් නැවත පණ ගැන්වීමේ කාර්යයට අප බැඳී සිටිනවා. අප මේ සඳහා වෙහෙසී කටයුතු කිරීම අවශ්‍යයි. අනෙකුත් දකුණු ආසියානු රටවල් දෙස අපගේ අවධානය යොමු කරන විට නිදහසින් පසු ඔවුන් අප පසුකරමින් සංවර්ධනයේ විශිෂ්ට මට්ටම කරා ළඟා වී සිටිනවා.

නෝනාවරුනි, මහත්වරුනි

අප දෙරටටත් කලාපයටත් ඉතා දීප්තිමත් අනාගතයක් තිබෙනවා. වාසි අවාසි නොතකා හැරියහොත් අප දෙරට ද මානව සම්පත් සංවර්ධනය අතින් විශිෂ්ට මට්ටමකට ළඟා වී තිබෙනවා. අතීතයේදී අප අපගේ රටවල් වෙනුවෙන් සැලසුම් සහගත අරමුණුවලට ප්‍රමුඛත්වය ලබා දුන්  නිසා අපට මෙම තත්ත්වයට ළඟා වීමට හැකි වූවා. අපගේ අතීත සාර්ථකත්වයන් පිළිබඳව පැමිණිලි කිරීමට අපට නොහැකියි.

ජනාධිපතිතුමනි, නෝනාවරුනි, මහත්වරුනි

අපගේ අනාගතය දීප්තිමත් කර ගැනීමට අපට අවශ්‍ය නම් අපගේ සංවර්ධන අවශ්‍යතා සඳහා අපට නියත හා පැහැදිලි සැලැස්මක් අවශ්‍යයි. ළඟා කර ගැනීමට අවශ්‍ය දෑ පිළිබඳ දැනුම සහ ස්ථිර උනන්දුවත් අපගේ අරමුණු කරා ළඟා වීමට අවශ්‍යයි. අප කලාපය ආසියානු සේද මාවතේ වැදගත් සංදිස්ථානයක් බවට යළි පත් කිරීම මාගේ නොසැලෙන දැක්මයි. එය සැබෑ වනු ඇතැයි මා දැඩි ලෙස විශ්වාස කරනවා.

මේ හේතුවෙන් සංචාරක කර්මාන්තය ආදී ද්විපාර්ශවික යාන්ත්‍රණයන් හරහා අපගේ ද්විපාර්ශ්වික සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීමේ වැදගත්කම
මම නැවත අවධාරණය කරනවා. ඉන් සමහරක් නැවත පණ ගැන්වීමට අවශ්‍යයි.

අප දෙරට අතර මෑතකදී ඇති කර ගන්නා ලද ඒකාබද්ධ පුළුල් සම්බන්ධතා මෙම ද්විපාර්ශ්වික සම්බන්ධතා තව දුරටත් වඩාත් ශක්තිමත් කිරීමට ගත් සාර්ථක පියවරකි. ආර්ථික, වෙළඳ, අධ්‍යාපනික, ආගමන හා විගමන, සංචාරක, මත්ස්‍ය කර්මාන්තය, සංස්කෘතික, ඓතිහාසික සෞඛ්‍ය හා කලා යන ක්ෂේත්‍රවල මෙම සම්බන්ධතා විහිදී යයි.

ඒකාබද්ධ කමිටුව බලාපොරොත්තු වන අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම සම්බන්ධතා අඛණ්ඩව පවත්වා ගත යුතු බව මම අවංකවම ප්‍රාර්ථනය කරමි. 2008 වර්ෂයේදී කොළඹ දී පැවැත්වීමට නියමිත ඒකාබද්ධ කමිටුවේ මීළඟ සැසිවාරයේදී අප සත්කාරක රට වශයෙන් ක්‍රියා කිරීමට අපේක්ෂා කරනවා.

සංචාරක කර්මාන්තය පිළිබඳව කථා කිරීමේදී එය අප දෙරටටම වැදගත්. එම ක්ෂේත්‍රය වර්ධනය කිරීමට සම්පත් එක් කිරීම හා ඒ සඳහා කලාපීය වශයෙන් උත්සාහ දැරීම හා ඒ සම්බන්ධ පියවර දියත් කිරීමට යෝජනා කරනවා. ලෝකයේ වෙනත් රටවල පමණක් නොව අපගේම කලාපයේ රටවලද සංචාරකයන් ආකර්ශනය කර ගත හැකි

PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

ශක්තියකින් අප දෙරට සමන්විතය. ශ්‍රී ලංකාව ද අභ්‍යන්තර සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම පිළිබඳව අවධානය යොමු කර ඇත. ඓතිහාසික සම්බන්ධතා, කලාපීය විවිධත්වය සහ ජනතාව ඒ සඳහා හොඳ උත්ප්‍රේරක වනු ඇත.

නෝනාවරුනි, මහත්වරුනි

මෑතකදී අපගේ වෙළඳ ප්‍රජාවගේ දායකත්වය හේතුවෙන් ආර්ථිකයේ ආයෝජන වර්ධනය කර ගැනීමට හැකියාව ලැබී තිබේ. විශේෂයෙන් මැණික් හා ස්වර්ණාභරණ, රෝහල් ක්ෂේත්‍රය, නිමි ඇඳුම් හා මූල්‍ය සේවා යනාදී ක්ෂේත්‍ර වැදගත්ය. එසේම, දෙරටේම වෙළඳ ප්‍රජාව ආර්ථික වශයෙන් වූ සම්බන්ධතා ශක්තිමත් කිරීමටත්, නව ක්ෂේත්‍ර විවෘත කර ගැනීමටත් අපේක්ෂා කරනවා. එසේම, දෙරට අතර ආයෝජන සුරක්ෂිත කිරීමේ ගිවිසුමක් සම්පාදනය කිරීමට අපේක්ෂා කරනවා.

වෙළඳ ක්ෂේත්‍රයේ තරගකාරීත්වය සඳහා තාක්ෂණය හා සන්නිවේදනය වැදගත් වේ. එම තරගකාරිත්වය මත රැඳෙන්නට කලාපීය සම්බන්ධතා තව දුරටත් සංවර්ධනය කිරීමට අපට අවශ්‍යයි.

ශ්‍රී ලංකාව හා මාලදිවයින අතර කිලෝ මීටර 850ක දිගින් යුතු සබ්මැරීන් කේබල් ක්‍රමය ආරම්භ කිරීම පිළිබඳව මම සතුටු වෙමි. එහි අරමුණ වන්නේ ආර්ථිකය සංවර්ධනය කිරීමත් සුපිරි සන්නිවේදන ක්‍රමයක් හරහා දකුණු ආසියාවේ වෙළඳ සම්බන්ධතා වැඩි දියුණු කිරීමත්ය.

ජනාධිපතිතුමනි,

මාලදිවයිනේ මානව සම්පත සංවර්ධනය කිරීමට සහය වීමට ලැබීම පිළිබඳව ශ්‍රී ලංකාව ආඩම්බරයට පත් වෙනවා. ජනතාවගේත් සමාජයේත් සංවර්ධනය සඳහා ප්‍රමුඛතාව ලබා දීම සඳහා සාර්ථක ආර්ථික සංවර්ධන උපක්‍රම කලාපයේ වැඩ කරන ජනතාවගේ හැකියාවන් වර්ධනය කිරීමට හැකි බව මගේ රජය දැඩිව විශ්වාස කරනවා. මාලදිවයිනේ සිසුන්ට ශ්‍රී ලංකාවේ පාසල් හා විශ්වවිද්‍යාලවල ඉගෙනීමට අවස්ථාව උදා කර දී තිබෙනවා.

අපගේ ස්ථිර මිත්‍රත්වය වර්ධනය කිරීමට සාක්ෂි ලෙසින් මෑතකදී මාලේ හි මධ්‍යම පුස්තකාලයක් ගොඩනැඟීමට ශ්‍රී ලංකා රජය පියවර ගෙන ඇත.
ජනාධිපතිතුමනි, නෝනාවරුනි, මහත්වරුනි

වර්තමාන ගැටුම් අවස්ථාවලදී නිවැරදි වේලාවට අභියෝගවලට මුහුණ දීම හා ඒ හා සමඟ ගනුදෙනු කිරීම මඟින් ආරක්ෂාව හා සමෘද්ධිය සැබෑ කර ගැනීමට අප ක්‍රියා කර ඇත. එසේම වෙනස්වීම්වලට සැලසුම් සකස් කිරීමේදී බාධාවන් මඟ හැරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදයට සාර්ථකව මඟ පෙන්වීමට ඔබ ජනාධිපතිතුමා විසින් කරන ලද යෝජනා පිළිගන්නවා.

PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

ශ්‍රී ලංකාව හා මාලදිවයින සාර්ක් සමුළුවේ ආරම්භකයින් වේ. අප දෙරට සාර්ක් සමුළුව හා සමඟින් ම ද්විපාර්ශ්වික සම්බන්ධතා පුළුල් කර ගන්නා ලදී. අපගේ සංවිධානයේ අරමුණු ළඟා කර ගැනීම උදෙසා සාර්ක් කලාපීය සාමාජික රටවල් ලෙස අප එක්ව අඛණ්ඩව කැපවී ක්‍රියා කිරීමට නැවත නැවතත් අපේක්ෂා කරනවා.

අද වැනි විශේෂ අවස්ථාවක දී ද්විපාර්ශ්වික සම්බන්ධතාවල නියත වර්ධනයක් මට අවශ්‍ය කරනවා. මෙතැන් සිට අප සමෘද්ධිය ළඟා කර ගැනීමට හා ආර්ථිකය වර්ධනය කිරීම සහතික කිරීමට පියවර ගත යුතු වෙනවා. අනාගතයේ දී අපගේ පොදු අරමුණු ඉටු කර ගැනීමට අව්‍යාජව උනන්දුවෙන් එක්ව කටයුතු කිරීමට අඛණ්ඩව පියවර ගනිමු. අනාගතයේ දී අප ඉටු කර ගත් අපේක්ෂා පිළිබඳව සහ අප ගත් ක්‍රියාමාර්ග නැවත සිහි කිරීමට අපට ඉඩ දෙන්න.

ජනාධිපතිතුමනි,

අවසාන වශයෙන් මගේ මාලදිවයින් සංචාරයේදී කරන ලද ආගන්තුක සත්කාරයත්, ගෞරවනීය මිත්‍රත්වයත් අගය කරමි. එසේම, ජනාධිපතිතුමාට ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස හෘදයංගම ව ආරාධනා කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. එම සංචාරය අපගේ ඉදිරි සම්බන්ධතාවල ප්‍රගමනයට හේතු වනු ඇත.

නෝනාවරුනි, මහත්වරුනි

අප දෙරට අතර පවත්නා සම්බන්ධතාව වෙනුවෙන්, මවුමුන් අබ්දුල් ගයූම් මහතා සහ එම මැතිනියගේත්, අපගේ විශිෂ්ට අමුත්තන්ගේත් සමෘද්ධිය හා සෞභාග්‍යය ප්‍රාර්ථනා කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

මෙය අපගේ ද්වී පාර්ශවීය සම්බන්ධතා වර්ධනය කර ප්‍රාණවත් කර ගැනීමට අවස්ථාවක් කර ගනිමු.

PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com